# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2454/39 - 2025 සැප්තැම්බර් මස 17 වැනි බදාදා - 2025.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියෝගය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සහ පී. වී. 66705 ලියාපදිංචි අංකය දරන සහ අංක 249/1, මාලඹේ පාර, කොස්වත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටුවා ඇති සමාගමක් වන උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන කේඅයියූ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ කරන ලද නියමයට අදාළ සහ 2015 ජනවාරි 07 වැනි දින අංක 1896/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද I වන උපලේඛනය, එම I වන උපලේඛනයේ පහත සඳහන් කොන්දේසිය (vi) එකතු කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ.

(vi) කේඅයියූ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කිරීමේ දී අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව (එස්. එල්. කියු. එෆ් 6 වන ස්ථරයේ) කටුචිකිත්සක විද්‍යාව පිළිබඳ වෛද්‍ය විද්‍යා ගෞරව උපාධි පාඨමාලාව සඳහා, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) එකවර ලබා තිබීම හෝ ඒ සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුලත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(අ) කෙසේ වෙතත්, ඉහත සඳහන් ප්‍රවේශ සුදුසුකමට අමතරව, ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක පහත සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කර ඇත්නම්, එම ශිෂ්‍යයාට/ ශිෂ්‍යාවට කටුචිකිත්සක විද්‍යාව පිළිබඳ වෛද්‍ය විද්‍යා ගෞරව උපාධි පාඨමාලාවට ඇතුළත් විය හැකිය -



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(I) චීනයේ Zhaoqing Medical College මගින් පිරිනමන "Acupuncture and Tuina Massage" ආශ්‍රිත උපාධිය

සහ

(II) උපාධි පාඨමාලාවේ අනුමත අධ්‍යයන සම්භාර ලබා ගැනීම සඳහා ඇති ඕනෑම හිඩැසක් පිරවීම සඳහා අවශ්‍ය සියලුම මොඩියුල පහත පරිදි වේ;

| පරතරය පිරවීම සඳහා පිරිනැමීමට නියමිත මොඩියුල | | |
|---|---|---|
| මොඩියුල මාතෘකාව | අධ්‍යයන සම්භාරය | අධ්‍යයන වර්ෂය |
| ACU1401<br>මානව ව්‍යුහ විද්‍යාව | 4 | 1 වර්ෂය |
| ACU1602<br>මානව භෞතවේදය | 6 | |
| ACU1403<br>ජෛවරසායන විද්‍යාව | 4 | |
| ACU1308<br>වසංගතවේදය | 3 | |
| ACU1309<br>පෝෂණය සහ ආහාරවේදය | 3 | |
| ACU2401<br>ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ පරපෝෂිතවේදය | 4 | 2 වර්ෂය |
| ACU2503<br>මහජන සෞඛ්‍යය | 5 | |
| ACU2405<br>ජීව සංඛ්‍යානය | 4 | |
| ACU2306<br>මූලික වෛද්‍ය, මනෝචිකිත්සක සහ ළමා රෝග තත්ත්වයන් | 3 | |
| ACU2108<br>මූලික ශල්‍යකර්ම, අක්ෂි සහ කන, උගුර, නාසය පිළිබඳ රෝග තත්ත්වයන් | 1 | |
| ACU4804<br>පර්යේෂණ නිබන්ධන | 8 | 4 වර්ෂය |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0175

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.